www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ගාසාව යලි අත්පත් කර ගැනීම: ඊස්රායලය හා මහා බොරුව

## The reoccupation of Gaza: Israel and the Big Lie

**ක්‍රිස් මාස්ඩන් විසිනි**
**2006 ජුලි 08**

තාර්කිකව ගත් කල, ඊස්රායලය තරම් නිර්ලජ්ජිතව ''මහා බොරු ගෙතීමේ'' ප්‍රචාරක තාක්ෂනය යොදා ගන්නා වෙනත් නවීන රාජ්‍යයක් නැත. ජුලි 6 දා සිට, සිවිල් වැසියන් ඇතුලු දුසිම් ගනනක් පලස්තීනයන් මරා දමමින් හා බොහෝ දෙනෙකුට තුවාල සිදු කරමින්, උතුරු ගාසාව යලි අත්පත් කර ගැනීම සඳහා ඊස්රායලය සිය මිලිටරි බලකායන් මෙහෙයවමින් සිටී.

ඉඩකඩම්, ගස්කොලන් සහ නිවාස බුල්ඩෝසර් කරමින් උතුරුදිග බීට් ලාහියා නගරයට යුද ටැංකි ඇදී ආවේ ය. සමහර ප්‍රදේශවාසීහු පලා ගියහ. අනෙක් අය බියෙන් සැඟවී ගත්හ. එක් අයෙක් බීබීසීයට මෙසේ පැවසී ය: "අප ජීවත් වෙන්නෙ යුද්ධයක. හමුදාව සියල්ලට ම පහර දෙනවා ... යුද ටැංකි නිසා එහෙ මෙහෙ යාම අනතුරුදායක යි. අද මා වැඩට ගියේ නැහැ. ඊයේ රෑ මා යුද ටැංකි 30ක් දෙපේලියට එන හැටි ගනන් කලා. ඒවාට හෙලිකොප්ටරවල ආරක්ෂාව තිබුනා. ඔවුන් උදේ සිවිල් වැසියන් දෙදෙනෙකු මරා දැමුවා."

ජුලි 5 දා දකුනුදිග ඊස්රායලයේ පිහිටි ඇශ්කලොන් නගරයට ක්වාසම් රොකට් ප්‍රහාරයක් එල්ල වීමත් සමගින් "ආරක්ෂිත කලාපයක්" ඇති කිරීම සඳහා ගැනීමට සිදු වූ අවශ්‍ය පියවරක් ලෙස, ගාසාවට එරෙහි ප්‍රහාර උත්සන්න කිරීමේ සිය මෑත ම ප්‍රයත්නය යුක්ති සහගත කිරීමට ඊස්රායලය වෑයම් කලේ ය.

රොකට්ටුව ඇද වැටුනේ ඒ වන විට හිස්ව පැවති උසස් පාසලක රථ ගාලට සුලු හානි පමුනුවමිනි. එහෙත් කිසිවෙකුටත් තුවාල සිදු නො වී ය. ඊස්රායල ආන්ඩුව සහ මාධ්‍ය මෙම සිදුවීම පලස්තීනයන් විසින් කරන ලද දැවැන්ත ආක්‍රමනශීලී ක්‍රියාවක් ලෙස වහා ම පින්තාරු කලේ ය.

රොකට්ටුව පුපුරා ගියේ ගාසා තීරය හා ඊස්රායලය වෙන් වන දේශ සීමාවෙන් කිලෝ මීටර් 10ක් ඊස්රායලය දෙසට වන්නට ය. එය මේ තාක් රොකට් ප්‍රහාරයක් ඊස්රායලය විනිවිද ගිය වැඩි ම දුර ප්‍රමානය යි. ඒ අනුව, මෙමගින් ඊස්රායල පුරවැසියන් විශාල සංඛ්‍යාවකගේ ජීවිත තර්ජනයට ලක්ව ඇති බව කියා පාන ලදි. අනතුරුව ක්‍රීඩා පිටියකට එල්ල වූ දෙවන රොකට් ප්‍රහාරයත් සමග මෙම උද්ගතය තව දුරටත් තීව්‍ර විය.

ඊස්රායල අගමැති එහුඩ් ඔල්මට් ලෝකාවසානය අඟවන නාටකාකාර තර්ජන මාලාවක් නිකුත් කලේ ය: රොකට් ප්‍රහාරය "පෙර නුවූ විරූ බැරෑරුම් උත්සාහයක්," "හමාස් සංවිධානය වගකිව යුතු වන ත්‍රස්ත යුද්ධය විශාල ලෙස උත්සන්න වීමක්" සහ ''ඊස්රායලයේ ස්වෛරී දේශ සීමා ඇතුලත ජීවත් වන ඊස්රායල සිවිල් වැසියන්ට අනතුරු සිදු කිරීමේ වෑයමකි." එය "දුරදිග යන ඵලවිපාක ඇති කරනු" ඇත. එකටෙක කිරීමේ දී ඊස්රායලය "ඉවසා සිටීමක් හෝ සීමාකාරී වීමක්'' නො කරනු ඇත.

හදිසි කැබිනට් රැස්වීමක් කැඳවනු ලැබුනි. "ත්‍රස්තවාදී කටයුතුවලට උපකාරී වන ආයතන හා යටිතල පහසුකම්වලට පහර දීම ගැන විශේෂ අවධානය යොමු කොට ... කල් පවතින හා ඉහල නැංවුන ආරක්ෂක ක්‍රියාවන් සඳහා (තම) සූදානම් වීම් දිගට ම කර ගෙන යාමට" සහ "ගාසා තීරය තීරුවලට වෙන් කිරීම දිගට ම කර ගෙන යමින් ත්‍රස්තවාදීන්ගේ නිදහස් ගමන්බිමන් සීමා කිරීමට" ඔල්මට් හා ආරක්ෂක ඇමති සහ ලේබර් පක්ෂ නායකයා වන අමීර් පෙරෙස්හට එහි දී බලය පැවරුනි.

"මා කල්පනා කරන විදියට බීට් හනවුන් හා බීට් ලාහියාවල මිනිස්සු බඩුමුට්ටු පොදි බැඳ ගන්න පටන් ගත්තොත් හොඳ යි," යනුවෙන් ආරක්ෂක ඇමති මන්ඩලයේ ජ්‍යෙෂ්ඨ ඇමතිවරයෙකු වන සීව් බොයිම් තර්ජනය කලේ ය.

බොහෝ මාධ්‍ය අටුවාකාරයන්ගේ ස්වරය ද එසේ ම රණකාමී විය. ඇශ්කලොන්වලට එල්ල වූ රොකට් ප්‍රහාර "යුද්ධය සඳහා හමාස්වරුන් නිසැකව ම කල ආරාධනාවක්" යැයි විස්තර කල, ලේබර් පක්ෂයට හිතවත් හා රෙස් පුවත්පතේ මිලිටරි විශ්ලේෂක සීව් ෂිෆ් නරක ම චූදිතයා විය.

ගොබල්ස් ප්‍රකටව ද තරයේ ද කියා සිටි පරිදි, ප්‍රචාරයේ කලාව වනුයේ "මහා බොරුවක්" ප්‍රකාශ කිරීම හා " එහි ම එල්බ ගෙන සිටීම" ය. යථාර්ථය ඔලුවෙන් සිටුවීම තරම් විශාල වෙනත් බොරුවක් නැත. ඊස්රායලය කරන්නේ පලස්තීන ආක්‍රමනශීලීත්වයට ප්‍රතිචාර දැක්වීම ය යන කියා පෑම සනාථ කිරීම සඳහා, හමාස්වරුන් සතුව තිබෙන නොදියුනු රොකට්ටුවලින් එල්ල වන තර්ජනය අමු අමුවේ අතිශයෝක්තියට නැංවීමට වැඩි යමක් අවශ්‍ය වෙයි. එහි අර්ථය වනුයේ අඟහරුවාදා රාත්‍රියට පෙර සිදු වූ සියල්ල නො තකා හැරීම යි.

කෝප්පරල් ගිලාඩ් ෂාලිට් නිදහස් කර ගැනීමේ ප්‍රෝඩාව මත ජූනි 28 දා දකුනු ගාසාව පලමුවෙන් ආක්‍රමනය කල තැන් පටන්, ඊස්රායලය පලස්තීනයන්ට එරෙහිව අසමසම වූ ද වඩ වඩාත් ලේ වැකි වූ ද ව්‍යාපාරයක් ගෙන යමින් සිටී. ඇශ්කලොන් රොකට් ප්‍රහාරය සිදු වූයේ, හමාස්වරුන් නායකත්වය දෙන පලස්තීන අධිකාරිය පෙරලා දැමීමටත් බටහිර ඉවුරෙන් භාගයක තරම් කොටසක් ඈඳා ගැනීමේ ඕල්මට්ගේ සැලසුමට එරෙහි සියලු ප්‍රතිරෝධයන් මැඩ ලනු පිනිස පලස්තීනයන් මත සාමූහික දඬුවම් පැමිනවීමටත් ඊස්රායලයට පවතින අභිප්‍රාය පැහැදිලිව පෙන්නුම් කර සතියක් ඉක්ම ගිය තැන දී ය.

ඊස්රායල ආරක්ෂක හමුදාව (අයිඩීඑෆ්), පලස්තීන අමාත්‍ය මන්ඩලයෙන් තුනෙන් එකක් වන හමාස් ඇමතිවරුන් අට දෙනෙකු ද බටහිර ඉවුරේ නීති සම්පාදකවරුන් දුසිම් දෙකකට ආසන්න ප්‍රමානයක් ද කොටු කර ගෙන සිටියි. නියෝජ්‍ය අගමැති සිමොන් පෙරෙස් පවසන්නේ ඔවුන්ට එරෙහිව ත්‍රස්තවාදී ක්‍රියා පිලිබඳව නඩු පවරන බව යි.

ඊස්රායල ආරක්ෂක හමුදා අගමැති ඉස්මයිල් හනියාගේ කාර්යාලවලට දෙවරක් බෝම්බ හෙලා ඇති අතර, ඩැමස්කස්හි පිටුවාහලේ ජීවත් වන හමාස් දේශපාලන නායක කාලිඩ් මේෂාල් සහ අන් අය මරා දමන බවට තර්ජනය කලහ. පසු ගිය සතියේ ඊස්රායල ජෙට් යානා ඩැමස්කස්හි පිහිටි ජනාධිපති බෂාර් අල්-අසාද්ගේ මාලිගය ඉහලින් සැරි සැරූ අතර සිරියාවෙන් පලි ගන්නා බවට ඔල්මට් තර්ජනය කලේ ය.

දිළිඳු ජනයාට සහ රයිෆල්වලට වැඩි යමක් තමන් සතුව නැති, යුද ටැංකිවලට එරෙහිව මරා ගෙන මැරෙන ප්‍රහාර එල්ල කිරීමට තර්ජනය කිරීම දක්වා සීමා වී සිටින සටන්කාමීන්ට එරෙහිව දහස් ගනනක් වූ මැනවින් සන්නද්ධ බලසේනා පෙල ගස්වා තිබේ.

මාර්ග, පාලම් හා එක ම බල උත්පාදන යන්ත්‍රය ද විනාශ කරමින්, ගාසාවේ දැනට මත් අබලන් වී ගොස් ඇති යටිතල පහසුකම්වලට ඊස්රායලය දිනපතා ගුවන් ප්‍රහාර එල්ල කරයි. සිවිල් ජනතාවට එල්ල කෙරෙන සාමූහික දන්ඩනයෙන් ගැල වී ඉස්පාසුවක් ලැබීමට වෑයම් කරන ඕනෑ ම කෙනෙකු ඉන් වලක්වනු පිනිස ඔවුන් ඊජිප්තුවේ ආධාර ඇතිව සියලු දේශ සීමා වසා දමා තිබේ.

ගාසා තීරය මධ්‍යයේ තිබෙන නසීරත් අනාථ කඳවුරේ වැසියෙකු වන 40 වියැති මාමුද් මුගාරි දැනට පැතිරී ගෙන යන මානුෂික ව්‍යසනය පිලිබඳව බීබීසීයට මෙසේ කරුනු දැක්වී යඃ "සතියකට පෙර අපට හැම විට ම විදුලිය තිබුනා, දැන් දිනකට පැය අටක් විතර යි. කලින් ජලය ලැබුනේ දින තුනකට දින දෙක යි, දැන් සෑම දින තුනකට ම පැය හතර යි ... මට ළමයි ගැන බය යි, ලෙඩ රෝග ගැන බය යි."

විශාල ශබ්ද ඇති කිරීම පිනිස ඊස්රායලය විසින් පහලින් ගමන් කරවන ජෙට් යානා පිලිබඳව කියූ ඔහු, "කුඩා දරුවන් ඒවා නිකම් ශබ්ද බව තේරුම් ගන්නේ නැහැ. මගේ සිව් හැවිරිදි දියනිය ඒක පිපිරීමකැයි සිතා අවදි වී කෑ ගසමින් මගේ කාමරයට දුව එනවා" යි පැවසී ය.

"යුද්ධය සඳහා නිසැකව ආරාධනා" කරන ඇත්ත ක්‍රියාවන් වනුයේ මේවා ය. එනම්, තමන් ගොදුරක් බවට පත්ව ඇතැයි නින්දිත ලෙස පින්තාරු කර ගන්නා රජයක් විසින් කර ගෙන යනු ලබන ආක්‍රමනශීලී යුද්ධය යි.

සිය විදේශ ප්‍රතිපත්තියේ ප්‍රධාන අංගය ලෙස "මහා බොරු ගෙතීම" යොදා ගත් නාසින් වැනි පූර්ව පාලකයන්ට නොතිබූ එක් වාසියක් ඊස්රායලය සතුව තිබේ. එනම් මොවුන්ගේ බොරු ඇමරිකාව සහ යුරෝපා බලවතුන් විසින් නියම හොඳ කාසි ලෙස සැලකීම යි. සුපුරුදු ලෙස ම, ගාසාව තුලට ඊස්රායලය රිංගා ගැනීම හෙලා දැකීමේ එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මන්ඩල යෝජනාවක් නිෂේධ බලය යොදා වැලැක්වීමට වොෂින්ටනය සමත් විය. එහෙත් ඔවුන්ට මෑතක පිහිටුවන ලද එක්සත් ජාතීන්ගේ මිනිස් අයිතිවාසිකම් කවුන්සිලය තුල දී ඊස්රායලය පලස්තීනයන් සාමූහික දන්ඩනයට යටත් කිරීම හෙලා දැකීමේ යෝජනාව ඉවත දැමීමට නුපුලුවන් විය.

ඉස්ලාමීය රාජ්‍යයන් විසින් ගෙන එනු ලැබූ යෝජනාව මගින්, "පුලුල් කෙරුනු වර්තමාන ඊස්රායල මිලිටරි ක්‍රියාන්විතය ද ඇතුලුව ඊස්රායල වාඩි ලා ගැනීම මගින් සිදු වී ඇති පලස්තීන ජනයාගේ මානුෂික අයිතිවාසිකම් උල්ලංඝනය වීම් පිලිබඳ ගැඹුරු කනස්සල්ල" ප්‍රකාශ විය.

"අත් අඩංගුවට ගත් සියලු පලස්තීන ඇමතිවරුන් සහ අත් අඩංගුවට ගත් අන් සියලු පලස්තීන සිවිල් වැසියන් වහා ම නිදහස් කරන ලෙස ආක්‍රමනික බලවතා වන ඊස්රායලයට" බල කල එය, "වර්තමාන අර්බුදයට සාකච්ඡාමය විසඳුමක්" ඉල්ලා සිටියේ ය.

කවුන්සිලයේ සාමාජික රාජ්‍ය 47න් විසිනවයක් යෝජනාවට සහාය දුන්නේ ය. එකොලහක් විරුද්ධ විය. පහක් ඡන්දය දීමෙන් වැලකී සිටි අතර සාමාජිකයෝ දෙදෙනෙක් පැමින නොසිටියෝ ය. යෝජනාවට විරුද්ධ වූවන් අතරට බ්‍රිතාන්‍යය, ප්‍රන්සය හා ජර්මනිය අයත් විය.

ජිනීවාහි සිටින එක්සත් ජාතීන්ගේ ඇමරිකානු නියෝජිත වොරන් ටිච්නෝර් කියා සිටියේ, යෝජනාව "ඊස්රායලය පමනක් වෙන් කර ඉලක්ක කර ගැනීමේ අසමතුලිත වෑයමක්" බව යි.

එය සමතුලිත නො වේ ය යන මේ හා සමාන කියා පෑම්වලින්, යුරෝපා රාජ්‍ය යෝජනාව කෙරෙහි දැක්වූ සිය විරුද්ධත්වය යුක්ති සහගත කලේ ය. මෙය සිදු වන්නේ, "සියලු අදාල පාර්ශ්වයන් ජාත්‍යන්තර මානුෂික නීතියේ නියෝගවලට ගරු කල යුතු යැයි ද සිවිල් වැසියන්ට එරෙහි ප්‍රචන්ඩත්වයෙන් වැලකිය යුතු යැ"යි ද අත් අඩංගුවට පත් සියලු සටන්කරුවන්ට හා සිවිල් වැසියන්ට "කුමන තත්වයක් යටතේ දී වුවත් ජිනීවා ප්‍රඥප්තියට අනුව සැලකිය යුතු යැ"යි ද දෙපාර්ශ්වයෙන් ම ඉල්ලා සිටි සංශෝධනයන් ද තිබිය දී ම ය.

"ඊස්රායල් ආරක්ෂක බලකායන් බලය ඉක්මවූ ක්‍රියාවන්හි යෙදවීමෙන් සිදු වූ ජීවිත හානි සහ එතුලින් උත්සන්න වූ මානුෂීය අර්බුදය" හෙලා දකිමින් යුරෝපා සංගමය ප්‍රකාශයක් නිකුත් කලේ ය. එහෙත් එක්සත් ජාතීන්ගේ සංගමය තුල ඔවුන්ගේ රංගනයේ තීරනාත්මක අවස්ථාව පැමිනි විට, එකදු යුරෝපා බලවතෙකු වත් ඊස්රායල යුද අපරාධවල නියම අනුග්‍රාහකයා වන වොෂින්ටනය උදහස් කර ගැනීමේ අන්තරාය ඇති වන කිසිවක් නොකරන බව ඕනෑවටත් වඩා පැහැදිලි ය.

© www.wsws.org